# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

## EN45E1 රේල් පීලි සඳහා ගැළපෙන අඩු උස කොන්ක්‍රීට් සිල්පර 3,000 ක් නානුඔය අංගනය වෙත සැපයීම සඳහා ප්‍රසම්පාදනය

## IFB අංකය - SRS/F.8120

1. කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන්, දෙපාර්තමේන්තු (මහා) ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් EN45E1 රේල් පීලි සඳහා ගැළපෙන අඩු උස කොන්ක්‍රීට් සිල්පර 3,000 ක් නානුඔය අංගනය වෙත සැපයීම සඳහා දේශීය නිෂ්පාදකයින් / සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.a

2. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.

3. අභිලාෂී යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට 2025.06.18 දින සිට 2025.07.15 දින තෙක් කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පහත සඳහන් ලිපිනයේදී වැඩිමනත් විස්තර ලබාගැනීමටත් ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් හැකිය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

| | | |
|---|---|---|
| **දුරකථන අංක** | : | **94(11)2438078 හෝ 94(11)4600202** |
| **ෆැක්ස් අංකය** | : | **94(11)2432044** |
| **ඊමේල්** | : | **srs.slr@gmail.com,tender1@railway.gov.lk** |
| **වෙබ් අඩවිය** | : | **www.railway.gov.lk** |

4. ලංසුකරු, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත පසුගිය වසර පහ (05) තුළ කොන්ක්‍රීට් සිල්පර 5,000 කට වැඩි සංඛ්‍යාවක් හෝ රු. මිලියන 50 කට වැඩි අගයක පෙර සවිගැන්වූ කොන්ක්‍රීට් බාල්ක සපයා තිබිය යුතුය. නැතහොත් රු. මිලියන 500 කට වැඩි අගයක පෙර සවි ගැන්වූ කොන්ක්‍රීට් කණු සපයා තිබිය යුතුය. ඉන්වොයිස් පිටපත් ඉදිරිපත් කළ යුතු වේ.

5. අභිලාෂී ලංසුකරුවන්ට ශ්‍රී ලංකාව, කොළඹ -10, ඕල්කොට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා රු. 18,450/= ක ආපසු නොගෙවන ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2025.06.18 දින සිට 2025.07.15 දින ප.ව. 3.00 දක්වා ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

6. සෑම ලංසුවක් සමගම ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණයේ වටිනාකම රු. 900,000.00 ක් වන අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත කළ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැංකුවකින් නිකුත් කළ කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතුය.

7. ලංසු, 2025.07.16 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර පහත ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතු අතර, ලංසු භාරගැනීමේ වේලාව අවසාන වූ වහාම ලංසු විවෘත කෙරේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වන මෙන් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු (මහා) ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කොට් මාවත, කොළඹ 10.**

**යොමු අංකය : SRS/F.8120**

**සභාපති,**
**දෙපාර්තමේන්තු (මහා) ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**